10 ශ්‍රේණිය දෙවන වාරය

# මයිකල් ආංජලෝ ශිල්පියාගේ නිර්මාණ

## විදේශීය ශිල්පීන්ගේ කලා කෘතීන් අගය කිරීම

## පුනරුද යුගය

- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ සිතුවම් හා මූර්ති නම් කිරීම
- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණ, තොරතුරු එක්රැස් කිරීම
- නව නිර්මාණාත්මක ශෛලීය සඳහා පදනම් වූ ශිල්ප ක්‍රම විස්තර කිරීම
- සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කිරීම
- මයිකල් ආන්ජිලෝ ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට හා රසාස්වාදයට ලක් කරීම

G / VIDYARAJA NATIONAL SCHOOL, THAWALAMA. chamie023@gmail.com 071 3060638





# මයිකල් ආන්ජිලෝ

මයිකල් ආන්ජිලෝ ක්‍රි.ව. 1475 ඉතාලියේ ෆ්ලොරන්ස් නගරයේ කාසල් කැප්රිස් නම් ස්ථානයේ දී උපත ලැබී ය.

ඔහු චිත්‍ර, මූර්ති හා කැටයම් කලාව හා වාස්තු විද්‍යාව සඳහා සහජ දක්ෂතාවක් දැක්වූ අතර පුබුදු යුගයේ බිහි වූ විශිෂ්ට කලා ශිල්පියෙකු ලෙසින් හැඳින්විය හැකි ය.

G / VIDYARAJA NATIONAL SCHOOL, THAWALAMA. chamie023@gmail.com 071 3060638

ඔහු විසින් කිරිගරුඬ මාධ්‍යයෙන් කරන ලද විශිෂ්ට මූර්ති

- පියෙටා
- ඩේවිඩ්
- මෝසෙස්
- මියයන වහලා
- කැරලිකාර වහලා
- 1 වැනි  ජූලියස් පාප්තුමාගේ සොහොන් ගෙය
- බෲගස්හි මරිය මව්තුමිය

සිතුවම්

- සිස්ටයින් දෙව්මැදුරේ අඳින ලද සිතුවම්
- ශුද්ධ වූ පවුල නමින් කැන්වසය මත තෙල් සායම් මාධ්‍ය සිතුවම

# මයිකල් ආන්ජිලෝ විසින් කිරිගරුඬ මාධ්‍යයෙන් කළ මූර්ති



මියෙන වහලා



කැරලිකාර වහලා



බෲගස්හි මරිය මව්තුමිය

# මයිකල් ආන්ජිලෝ විසින් අඳින ලද සිතුවම්



සිස්ටයින් දෙව්මැදුරේ චිත්‍ර



ශුද්ධ වූ පවුල



- මයිකල් ආන්ජිලෝ මෙම මූර්තිය නිර්මාණය සඳහා තේමා කරගෙන ඇත්තේ කුරුසියෙන් ඉවත් කරන ලද මිය ගිය ජේසුස් වහන්සේගේ අප්‍රාණික සිරුර මරිය මව්තුමිය විසින් උකුලෙහි හොවාගෙන සිටින ආකාරයයි.
- " කිරිගරුඬ" මාධ්‍යයෙන් නෙළා ඇති මෙම පූර්ණ උන්නත මූර්තිය රෝමයේ ශාන්ත පීතර දෙව් මැදුරේ ප්‍රදර්ශනය කර ඇත.





- ජේසුස් වහන්සේගේ අප්‍රාණික ශරීර ස්වභාවය තාත්විකව හා මරියතුමියගේ සළුපිළිවල රිද්මයානුකූල බව ඉතා ස්වභාවිකව කිරිගරුඬ මාධ්‍යයෙන් නිරූපණය කර ඇත.
- මව සහ පුතු සමවයස්ව දැක්වීමෙන් දිව්‍යමය ස්වභාවය මතුකිරීමට උත්සාහයක් දරා ඇත.
- මානුෂිකත්වය පිළිබඳ අනුවේදනීයත්වය මෙම නිර්මාණයෙන් ධ්වනිත කරයි.



# ඩේවිඩ් - David

ශක්තිය, නිර්භීතභාවය, මානව දයාව හා තාරුණ්‍ය යන ගුණාංග මෙම මූර්තියෙන් මැනැවින් නිරූපිත ය.

කිරිගරුඬ මාධ්‍යයෙන් පූර්ණ උන්නත ලෙස නිර්මාණය කර ඇති මෙම ප්‍රතිමාව අඩි 14 අඟල් 03 පමණ උසින් යුතු නග්න පුරුෂ රුවකි.

ග්‍රීක-රෝම මූර්ති සම්ප්‍රදායට අනුව මානව දේහයේ සුන්දරත්වය, කඩවසම් බව හා රිද්මය ස්වභාවික හා තාත්විකව නිරූපණය කර ඇත.






chamie023@gmail.com 071 3060638

රෝමයේ සිස්ටයින් දෙව් මැදුරේ වියන්තල සිතුවම (ලෝකෝත්පත්ති කතාව)



ආදම් මැවීම

මයිකල් ආන්ජිලෝ විසින් රෝමයේ සිස්ටයින් දෙව් මැදුරේ ෆ්‍රෙස්කෝ ශිල්ප ක්‍රමයෙන් නිර්මාණය කරන ලද වියන්තල සිතුවම් අතුරින් වැදගත් නිර්මාණයකි.



ආදම්ගේ තාරුණ්‍ය



දෙවියන් වහන්සේගේ
මහලු ස්වරූපය



මෙම සිතුවමෙහි, දේව දූතයින් සමඟ සිටින දෙවියන් වහන්සේ ආදම් වෙත ඇඟිල්ල දිගු කර සිටින අතර ආදම් විසින් දෙවියන් වහන්සේ වෙත අත දිගු කර සිටින ආකාරය නිරූපනය කරයි.

දෙවියන් වහන්සේගේ මහලු ස්වරූපය සහ ආදම්ගේ තාරුණ්‍ය මැනවින් නිරූපණය කර තිබේ. ඔහුගේ මූර්තිවල දැකිය හැකි ශක්ති සම්පන්න හා ජවසම්පන්න බව මෙම චිත්‍ර නිර්මාණයෙහි ද මැනවින් දැකිය හැකි ය.



සිස්ටයින් දේව් මැදුරේ අල්තාරය




රෝමයේ වතිකානු නගරයේ සිස්ටයින් දෙව් මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ මෙම සිතුවම නිර්මාණය කර ඇත.



## අන්තිම විනිශ්චය - (Last Judgment)

රෝමයේ වතිකානු නගරයේ සිස්ටයින් දෙව් මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ මෙම සිතුවම නිර්මාණය කර ඇත.

ලොව විශාලතම ප්‍රෙස්කෝ සිතුවම ලෙස සැලකෙන මෙය අඩි 48 x 44 ප්‍රමාණයෙන් යුක්ත ය.

මයිකල් ආන්ජිලෝ විසින් මෙම චිත්‍රය ප්‍රධාන කොටස් 3 කට බෙදා එය ස්වර්ගය, මනුලොව හා පරලොව ලෙස සංකේතාත්මකව නිරූපණය කර ඇත.

ශිල්පියාට ආවේණික වූ ස්වභාවික හා තාත්වික ශෛලීය ලක්ෂණ සහිතව මෙම චිත්‍රය සංරචනය කර තිබේ.

එහි දී මිනිස් රූපවල කායික ලක්ෂණ හා ක්‍රියාකාරී ලක්ෂණ සමග හැඟීම් ප්‍රකාශනය මැනවින් නිරූපණය කර ඇත.